## ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
---------------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරන අඩුපාඩු

#### (අ) මූලධන වියදම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2020 වර්ෂයට අදාළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් 2020 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් කාණ්ඩ 33 ක ශේෂයන්, 2021 ජනවාරි 01 දිනට පැවති ශේෂයන් සමඟ සැසඳීමේදී රු. බිලියන 27.28 ක් වැඩියෙන් පැවති අතර, තවත් වත්කම් කාණ්ඩ 23 ක එම ශේෂය අතර රු. බිලියන 51.3 ක ඌණතාවයක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද සංචලන වාර්තාව උපචිත පදනම මත පිළියෙල කරන නමුත්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් මුදල් පදනම මත පිළියෙල වී ඇති බැවින් මෙවැනි වෙනස්කම් නිරීක්ෂණය වන බව. | අදාළ සංඛ්‍යා නොසැසඳීමට හේතුව මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |
| ii. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) රු. බිලියන 7.91 ක වර්ෂ අවසාන නොනිමි වැඩ ශේෂයක් දක්වා තිබුණු අතර, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2021 දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ ශේෂය රු. බිලියන 3.17 ක් වූයෙන් රු. බිලියන 4.74 ක වෙනස්කම් පැවතුණි. | වර්ෂය තුළ සත්‍ය වශයෙන් දරන ලද වියදම හා ඉංජිනේරු සේවාවන්වලට වෙන්කළ ප්‍රතිපාදන අතර, වෙනස්කම් හේතුවෙන් මෙම වෙනස පැන නැඟී ඇති බව. | වර්ෂ අවසානයේ ගෘහ නිර්මාණ ශිල්පියාගේ සහතික කළ වැඩවල වටිනාකමමත නොනිමි වැඩ ගිණුම්ගත කළයුතු වීම. |

### 1.6.2 ලේඛන පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව හෝ මු.රෙ 502(2) ප්‍රකාර එහි II වැනි පරිශිෂ්ඨය පරිදි ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන යා යුතු වුවද, යුද්ධ හමුදාවට අයිති හා දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 213 කට අදාළ අක්කර 9,420 ක ඉඩම් ලේඛනයක සටහන් කර තිබුණද, ඉහත විධිවිධාන ප්‍රකාරව විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක විස්තර ඇතුළත් කර නොතිබුණි. | යුද්ධ හමුදාව වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු අවසන්ව ඇති නමුත්, තක්සේරු කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇති මෙම ඉඩම් හැකි ඉක්මණින් තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව. | අදාළ චක්‍රලේඛ විධිවිධාන හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

### 1.6.3 තැන්පතු ගිණුම් ශේෂ

------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | ------------------- | -------------- |
| යුද්ධ හමුදාව විසින් මෙහෙයවනු ලබන බැංකු ජංගම ගිණුම් 04 කට අදාළව නිකුත් කර ඇති මුත්, මාස 06 ක් ගත වූ පසුවත් බැංකු වෙත ඉදිරිපත් නොකළ එකතුව රු. මිලියන 24.19 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. 394 (ඇ) පරිදි කටයුතු නොකර, තැන්පතු ගිණුමකට මාරුකර තිබුණි. | කල්ඉකුත් වූ චෙක්පත් රාජ්‍ය ආදායමට බැර කිරීමෙන් පසුව නැවත ලබා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් හැකිතාක් දුරට වළක්වා ගැනීම සඳහා මු.රෙ.570 ට අනුව අදාළ පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 1.6.4 කුලී වැඩ අත්තිකාරම් ගිණුම්

-------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | ------------------- | -------------- |
| පුද්ගලික ආයතන 03 කින් කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේ නව ගිවිසුම් අත්සන් කර තිබුණු අතර, එම තත්ත්වය යාවත්කාලීන නොකර පසුගිය වර්ෂයේ කුලී අත්තිකාරම් ශේෂයන්ම පදනම්කර ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් එකතුව රු. මිලියන 18.37 ක් වැඩියෙන්ද, රු. 86,750 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම මගින් හෙළිදරව්කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂයේ පුද්ගලයින් හා පුද්ගලික ආයතන පහක් සමඟ එළඹ තිබුණු කුලී අත්තිකාරම් ගිවිසුම් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට අනාවරණය කළ යුතු එකතුව රු. මිලියන 16.48 ක වර්ෂ අවසාන ශේෂයද මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට මහා භාණ්ඩාගාරය වෙතින් ඉල්ලීම් කර ඇති බව හා තවදුරටත් අය විය යුතු ප්‍රමාණය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව. | කුලී වැඩ අත්තිකාරම් ගිණුම් යාවත්කාලීනව පවත්වා ගැනීමටත්, එම යාවත්කාලීන අගයන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අග්‍රිම ගිණුම් ශේෂය රු. මිලියන 131.23 ක් වූ අතර, සුඩාන සහ මාලි සාම සාධක රාජකාරි සඳහා ලබාදුන් එකතුව රු.මිලියන 5.26 ක අත්තිකාරම් සහ 2017 වර්ෂයේ ලබාදුන් රු. 448,198 ක විදේශ අත්තිකාරම් මුදලද පියවා නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව. | නිරවුල් කළ හැකි ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයන් දෙකක් සඳහා සලසා ගෙන තිබුණු එකතුව රු.බිලියන 1.03 ක ප්‍රතිපාදන හා 222-01-13-2104 දරන මූලධන වැය විෂය සඳහා සලසා ගෙන තිබුණු රු.මිලියන 100 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීමෙන් මෙම ඉතිරිවීම් සිදු වී ඇති බව. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මූලධන වැය විෂයයන් 16 ක් සඳහා එකතුව රු.බිලියන 7.1 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 2.84 ක ප්‍රතිපාදන ද, පුනරාවර්තන වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු. බිලියන 2.74 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 401.77 ක ප්‍රතිපාදනද, උපයෝජනය කර නොතිබුණි. එම ඉතිරිකිරීම් ප්‍රමාණය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වයමත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීම සහ ප්‍රමාණවත් පරිදි ද්‍රවශීල මුදල් නොලැබීමමත මෙම ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුවී ඇති බව. | - එම - |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයන් හතරක සහ මූලධන වැය විෂයක සලසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ. 66 යටතේ පිළිවෙලින් රු.බිලියන 1.26 ක් සහ රු. මිලියන 177. 87 ක් වෙනත් වැය විෂයන් වලින් මාරු කරගෙන තිබුණු අතර, පුනරාවර්තන වැය විෂයන් අටක | වැය විෂයන්වලින් ඉතිරි වූ ප්‍රතිපාදන කළමනාකරණය කර ගන්නා ලෙස භාණ්ඩාගාරය ලබාදුන් උපදෙස්මත අදාළ මාරු කිරීම් කරගෙන ඇති බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| | රු. බිලියන 85. 97 ක් ද, මූලධන වැය විෂයන් පහක රු. බිලියන 1.95 ක් ද වශයෙන් වෙන්කරගෙන තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පිළිවෙලින් රු.බිලියන 10.12 ක හා රු. බිලියන 3.54 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනද සලසා ගැනීමට සිදුවී තිබුණි. | | |
| (ඈ) | මූලධන වැය විෂයන් දෙකක් සඳහා ලබාදුන් එකතුව රු. මිලියන 507.56 ක සම්පූර්ණ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයම වර්ෂය අවසානයට ඉතිරි කර තිබුණි. | ප්‍රමාණවත් පරිදි ද්‍රවශීල මුදල් නොලැබීම නිසා මෙම ඉතිරිවීම් සිදු වී ඇති බව. | - එම- |
| (ඉ) | වැය විෂයන් හතරක් සඳහා අවස්ථා හතරකදී ලබාදුන් එකතුව රු. බිලියන 3.04 ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් එකතුව රු. බිලියන 1.49 ක් හෙවත් සියයට 49 ක් වර්ෂය අවසානයට ඉතිරිකර තිබුණි. | - එම - | -එම- |
| (ඊ) | 222-01-02-0-1205 (සැපයීම්-වෙනත්) වැය විෂය සඳහා රු. බිලියන 4 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර, රු.මිලියන 864.71 ක ඉදිරි වියදම් නොසළකා මෙම වැය විෂයෙන් රු. බිලියන 1.19 ක් 2021 ඔක්තෝබර් 25 දින වෙනත් පුනරාවර්ථන වැය විෂයන් තුනකට මු.රෙ.66 යටතේ මාරුකර ගෙන තිබුණි**.** | රාජ්‍ය මූල්‍ය අවකාශයේ පවතින සීමාවන් අනුව මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අදාළ මාරුකිරීම් සිදුකර ඇති බව. | - එම - |
| (උ) | වැය විෂයයන්/වැඩ සටහන්/ව්‍යාපෘති 23 ක් සඳහා ක්‍රියාකාරී සැලැස්මෙන් රු. බිලියන 15.08 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර තිබුණද, නිසි භෞතික කාර්යසාධනයකට ලඟා වී නොමැති නිසා එකී ඇස්තමේන්තු මුදලින් වර්ෂ අවසානයට රු. බිලියන 9.08 ක් හෙවත් සියයට 60 ක් ඉතිරිකර තිබුණි. තවද, මෙම වැය විෂයන් සඳහා වර්ෂ අවසානයට එළඹ තිබූ රු.බිලියන 1.57 ක බැරකම්ද සලකා බැලුවහොත් ලඟා කරගෙන තිබුණු මූල්‍ය කාර්යසාධනය සියයට 50 කට සීමාවී තිබුණි. | ප්‍රමාණවත් පරිදි ද්‍රවශීල මුදල් නොලැබීම නිසා මෙම ඉතිරිවීම් සිදු වී ඇති බව. | - එම |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සන්නිවේදන පද්ධති වැඩි දියුණු කිරීම සඳහා පනාගොඩ යුද හමුදා කඳවුර තුළ තෙමහල් මධ්‍යම අවි ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ආරක්ෂාව සහ ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා වන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා-ඉන්දියාව) යන ව්‍යාපෘති/වැඩසටහන් 03 සඳහා එකතුව රු. බිලියන 1.24 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, මෙම සම්පූර්ණ ප්‍රතිපාදනයම වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි. | කොවිඩ් වසංගත ගෝලීය තත්ත්වය නිසා ඇති වූ ප්‍රායෝගික ගැටලු හේතුවෙන් මෙම ඉතිරිවීම් සිදු වී ඇති බව. | - එම - |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1) හා 214 ප්‍රකාරව පනවා ඇති නියමයන් අනුව කටයුතු නොකිරීම නිසා මසක කාලයක් තුළ පියවීමට නොහැකිවූ බැරකම් අයිතම 3,027 ක් වූ අතර, එහි වටිනාකම රු. බිලියන 2.27 ක් විය. | භාණ්ඩාගාරය වෙතින් ද්‍රවශීල මුදල් නොලැබීම නිසා මෙම තත්ත්වය හට ගෙන ඇති බව. | බැරකම් කඩිනමින් බේරුම් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් ආයතන 43 කට ගෙවිය යුතු එකතුව රු. බිලියන 3.61 ක බැරකම් එම ආයතන විසින් සනාථ කර නොතිබුණි. තවද, සනාථ ලබාදුන් ආයතන 04 ක් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ බැරකම් ප්‍රමාණයට වඩා එකතුව. රු මිලියන 57.86 ක් අඩුවෙනුත්, ආයතන 11 ක් එකතුව රු. මිලියන 578.29 ක් වැඩියෙනුත් වාර්තාකර තිබුණි. | 2021.12.31 දින වන විට යුද්ධ හමුදාව වෙත සමහර බිල්පත් නොලැබීම නිසා ශේෂ අතර, වෙනසක් පැවතිය හැකි බව. | ශේෂ අතර වෙනස්කම්වලට හේතු නිශ්චිතව සොයා ගෙන නිවැරදි කිරීම් කඩිනමින් කළයුතු වීම. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වැය විෂයන් හතකට අදාළව වෙන්කර තිබුණු එකතුව රු.මිලියන 937.83 ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 497.22 ක් පමණක් වියදම්කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 440.61 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, මෙම ඉතිරි කිරීම් ප්‍රතිශතය සියයට 2 සිට සියයට 97 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. තවද, වර්ෂ අවසානයට මෙම ව්‍යාපෘති/වැඩසටහන්වල නිමකිරීම් ප්‍රතිශතය සියයට 03 සිට සියයට 98 ක් දක්වා පරාසයක පැවතුණි. | සැලසුම් වෙනස් වීම, ප්‍රසම්පාදන තීරණවල වෙනස්කම්, බිල්පත් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් වැනි හේතු නිසා අදාළ ඉතිරිවීම් සිදුවී ඇති බව. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු වීම. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය ඉක්ම වූ වර්ෂ 31 දක්වා කාල පරාසයක් තුළ සේවය හැරගොස් ඇති හමුදා නිලධාරින් 3,754 දෙනෙකුගෙන් සහ සිවිල් නිලධාරින් 527 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 53.18 ක ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.3 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගෙන නොතිබුණි. මෙම ණය ශේෂ වලින් රු.මිලියන 8.12 ක් වර්ෂ 10 ත් 31 ත් අතර ණය ශේෂ වන අතර, වර්ෂ 05 ට වැඩි ණය ශේෂවල වටිනාකම රු. මිලියන 25.12 ක් විය. | මෙම ණය ශේෂයන් අයකර ගැනීමට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මෙම ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වීම. |
| (ආ) | විශ්‍රාම ගිය හමුදා නිලධාරින් 569 දෙනෙකුගේ සහ සිවිල් නිලධාරින් 117 දෙනෙකුගෙන් වර්ෂය ඉක්මවූ වර්ෂ 16 දක්වා කාල පරාසයක් තුළදී අය නොවූ ණය ශේෂවල එකතුව රු.මිලියන 50.67 ක් වූ අතර, මෙම ණය ශේෂවලින් රු.මිලියන 3.28 ක් වර්ෂ 05 ඉක්ම වූ ණය ශේෂ වුවත්, ආයතන සංග්‍රහය xxiv පරිච්ඡේදයේ 4.2 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මෙම ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | මියගිය හමුදා හා සිවිල් නිලධාරින් 208 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු.මිලියන 5.44 ක් වූ අතර, මෙම ණය ශේෂවලින් රු. 341,169 ක් වර්ෂ 05 ට වැඩි ණය ශේෂ වුවත්, ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | වැඩ තහනම් කර ඇති සිවිල් නිලධාරින් 5 දෙනෙකුගෙන් අයවීමට ඇති වර්ෂ 05 ට වැඩි ණය ශේෂයන්ගේ එකතුව රු. 69,671 ක් විය. | - එම - | - එම - |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 103 (1) (ආ) | සමාලෝචිත වර්ෂයේ යුද්ධ හමුදාවේ වාහන 03 කට රිය අනතුරුවලින් සිදු වූ රු. මිලියන 2.03 ක අලාභානි සම්බන්ධයෙන් පොලිසියට වාර්තාකර නොතිබුණි. | ඉදිරියේදී සිදුවන රිය අනතුරු පොලිසියට වාර්තා කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | මුදල් රෙගුලාසි 104 (3),(4) | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වාහන 73 කට සිදු වූ එකතුව රු. මිලියන 64.89 ක අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තා හා සමාලෝචිත වර්ෂයේ රිය අනතුරුවලින් යුද්ධ හමුදාවේ වාහන 13 කට සිදු වූ එකතුව රු. මිලියන 5.17 ක අලාභ හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාද, රිය අනතුරු 9 කට අදාළව එකතුව රු. මිලියන 9.36 ක අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාද ඉදිරිපත්කර නොතිබුණි. | අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| **(iii)** | **මුදල් රෙගුලාසි 770(4) හා 770 (අ) (ආ)** | 2020 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල ධාවනයෙන් ඉවත් කළ වාහන 127 ක්ද, සමාලෝචිත වර්ෂයේ ධාවනයෙන් ඉවත්කළ වාහන 28 ක්ද ධාවනයට අයෝග්‍ය බවට තීරණයකර ඇතත්, අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි. | ත්‍රස්ථවාදීන්ගෙන් අත්පත් කරගත් වාහන සුන්බුන් වශයෙන් අපහරණය කිරීමට කටයුතු කරන බව හා, අනෙකුත් වාහන අපහරණය කිරීමට යාමේදී උද්ගත වූ ගැටලු නිරාකරණය කරමින් පවතින බව. | - එම - |
| (ආ) | **2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය** | යුද්ධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන ධාවන තත්ත්වයේ පවතින වාහන 2,464 කට අදාළව සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණු අතර, ප්‍රවාහන අංශය විසින් තීරණය කරනු ලබන ඉන්ධන දහනය වීම් ප්‍රමාණයන් අනුව ධාවන සටහන්/ප්‍රවාහන ගමන් බලපත්‍රවල ඉන්ධන තුලනය කිරීම් සිදුකර තිබුණි. | මේවන විට සැලකිය යුතු වාහන ප්‍රමාණයක ඉන්ධන දහනයවීම් පරීක්ෂාවන් සිදුකර ඇති අතර, ඉදිරියේදී මෙම වාහනවලද ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට පියවර ගන්නා බව . | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉදිකිරීම්, ප්‍රසම්පාදනයන්, කාර්ය මණ්ඩල පුහුණු ඇතුලු විවිධ වැඩසටහන් 23 ක් සඳහා සියයට සියයක ඉලක්ක ගත භෞතික ප්‍රගතියක් දක්වා තිබුණද, වැඩසටහන් 16 ක භෞතික කාර්යසාධනය සියයට 50 හෝ ඊට අඩු මට්ටමක පැවතුණි | භාණ්ඩාගාරයෙන් ද්‍රවශීල මුදල් නොලැබීම, ඉඩම් පවරා ගැනීමේදී හා ප්‍රසම්පාදනයේදී සිදු වූ ප්‍රමාදයන් මෙම තත්ත්වයට හේතු වී ඇති බව. | ඉලක්කගත සැලසුම් කරා ලඟාවීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------ | නිර්දේශය<br>------------------ |
|---|---|---|---|
| (අ) | වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා රු. බිලියන 36.59 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනය කර ගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයන් දක්වා නොතිබුණි. | වසර තුනක් සඳහා වන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව හා ඉදිරියේදී මිලදී ගනු ලබන ඒකක ප්‍රමාණයන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සැලසුම් සකස්කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිල සැඳැහුම් ක්‍රමය, ජාතික තරඟකාරී ලංසු ක්‍රමය සහ සීමිත/පාලිත ජාතික තරඟකාරී ප්‍රසම්පාදනයන ක්‍රමයන් අනුගමනය කරමින් සිදුකර තිබුණු රු. මිලියන 521.22 ක ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් අනාවරණය වූ පොදු කරුණු පහත දැක්වේ. | | |
| (i) | ආයතන 200 කට අධික ප්‍රමාණයකගෙන් මිල ගණන් ඉල්ලා තිබුණද, ලැබී තිබුණු මිල ගණන් සංඛ්‍යාව 10 කට අඩු ප්‍රමාණයක පැවතුණු අතර, මිලගණන් ඉල්ලීම් ලේඛන ලංසුකරුවන්ට යැවූ බවට තැපැල් කුවිතාන්සි හෝ විද්‍යුත් පණිවිඩ සනාථන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පැවති කොවිඩ් අවධානම නිසා බොහෝ ආයතන මිල ගණන් ඉදිරිපත් කර නොමැති බව. | ලංසු ඉල්ලුම් කිරීමේ විකල්ප ක්‍රම සොයා බැලීමටත්, අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතු වීම. |
| (ii) | ලංසු ලියාපදිංචි තැපැලෙන්ලද ඒවාද, ටෙන්ඩර් පෙට්ටියට බහාලූ ඒවාද යන්න විගණනයට අනාවරණය නොවුණු අතර, ලියාපදිංචි තැපැලෙන්ලද ලංසු සම්බන්ධයෙන් ලියාපදිංචි තැපැල විවෘතකළ ලේඛන හෝ ටෙන්ඩර් පෙට්ටිය විවෘත කිරීමේ ලේඛන පවත්වා නොතිබුණි. | ගණන් දීමේ නිලධාරී අදහස් දක්වා නොතිබුණි. | අදාළ ලේඛන පවත්වාගත යුතු වීම. |
| (iii) | ඇතැම් මිලදී ගැනීම් වලදී එක් එක් සැපයුම් කාණ්ඩ සඳහා සැපයුම්කරුවන් විශාල ප්‍රමාණයක් ලියාපදිංචි වී සිටියද ඉතා සීමිත සැපයුම්කරුවන් ප්‍රමාණයකගෙන් මිල ගණන් විමසා තිබුණු අතර, මෙම මිල ගණන් විමසූ | - එම - | ලංසුකරුවන් තෝරාගත් පදනම විගණනයට අනාවරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සැපයුම්කරුවන් තෝරාගත් පදනමද විගණනයට අනාවරණය නොකෙරුණි. | | |
| (iv) | ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ සිදුකළ රු.මිලියන 88.87 ක ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ලංසුවල අනුපිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | - එම - | ලංසුවල අනුපිටපත් විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (v) | 3.3 ප්‍රසම්පාදනය මාර්ගෝපදේශයේ සඳහන් නිර්නායකයන් පිළිබඳ නොසළකා රු.මිලියන 352.78 ක ප්‍රසම්පාදනයන් සඳහා සීමිත/පාලිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යොදාගෙන තිබුණි. | -එම - | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව වඩාත්ම සුදුසු ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගත යුතු වීම. |
| (ඇ) | එක් එක් ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් නිරීක්ෂණයවූ කරුණු පහත දැක්වේ. | | |
| (i) | රු.මිලියන 274.05 ක වියදමින් ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම සම්බන්ධව සිදුකළ විගණන නියදි පරීක්ෂාවේදී ලංසු විවෘත කිරීම සඳහා 6.3.3 හා 6.3.6 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව පවත්වා ගත යුතු ලේඛන නිසියාකාරව පවත්වා නොතිබුණු අතර, 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි. තවද, ගබඩාවට අදාළ ද්‍රව්‍ය ලැබුණු බවට සනාථ කරන ලියවිලි හෝ භාණ්ඩ ලැබීමේ තුංඩු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ගිවිසුම්ගත වීම වෙනුවට ලංසු සුරක්ෂණයක් හෝ කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කරන බව හා මිල ගණන් විවෘත කිරීමේදී අත්සන් ලේඛන පවත්වා ගැනීමක් සිදුකරනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම හා භාණ්ඩ ලැබීමේ තුණ්ඩු විගණනයට ඉදිරිපත් කළයුතු වීම. |
| (ii) | රු.මිලියන 66.26 ක වියදමින් සංඥා/ පරිගණක උපකරණ මිලදී ගැනීමේදී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වූ බවට තොරතුරු වාර්තාකර ඇතත්, රැස්වීම් වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, අයකළ යුතු රු. මිලියන 7. 95 ක ප්‍රමාද දඩ අයකර නොතිබුණි. තවද, 9.7.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සංචරණ සීමාවලට යටත්ව ආයතන දෙකක පමණක් සහභාගීත්වයෙන් පූර්ව ලංසු රැස්වීමක් පවත්වා ඇති බව හා සංචරණ සීමා නිසා ආයතන වසා තිබීමෙන් මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇති බව. | පූර්ව සුදුසුකම් පරීක්ෂාවට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු වීම හා ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද දඩ අය කළ යුතු වීම සහ විශාල තොරතුරු පද්ධති ප්‍රසම්පාදනයේ දී අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | රු.මිලියන 37.88 ක් වැයකර Cloth Swade Scarlet “58/60 ” මීටර් 7500 ක් මිලදී ගැනීමේදී අයකළ යුතු රු. මිලියන 5.05 ක ප්‍රමාද දඩ අයකර නොතිබුණු අතර, මෙම ප්‍රමාදය මත ඇ.එ.ජ. ඩොලරයේ අගය ඉහළ යාම නිසා රජයට රු. මිලියන 4.08 ක අතිරේක වැයබරක් දරා අදාළ රෙදි තොගය ප්‍රසම්පාදනය කර ගැනීමට සිදු වී තිබුණි. | ෂැන්හයි වරායේ යුධ අභ්‍යාසයක් පැවැත්වීම හේතුවෙන් නැව් ගමනාගමනය ප්‍රමාද වීම මත භාණ්ඩ තොගය ලැබීමට කල්ගත වී ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද දඩ අයකළ යුතුවීම. |
| (iv) | රු.මිලියන 36.45 ක් වැයකර Single Axis Foots and Components 1,400 ක් සහ Adaptors 1,920 ක් මිලදී ගැනීමේදී 4.2.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණු අතර, සුළු ප්‍රසම්පාදන කමිටු මඟින් සිදු කිරීමේ අපේක්ෂාවෙන් ටෙන්ඩර් දෙකක් වශයෙන් ක්‍රියාත්මක කිරීම නිසා එකවර ප්‍රසම්පාදනය කිරීමේදී ලබා ගැනීමට හැකිව තිබුණු මිල වාසිය ලබා ගැනීමට නොහැකි වී තිබුණි. 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ලබාගතයුතු අවම ලංසු ප්‍රමාණය ලබාගෙන නොතිබුණු අතර, 7.7 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ලංසු ලේඛනවල නිශ්චිතකොට දක්වා නොමැති ඇගයීම් සාධක ලංසු ඇගයීමේදී භාවිතාකර ප්‍රසම්පාදන තීරණ ගැනීම නිසා අඩුම මිල ඉදිරිපත්කළ ලංසුකරු තෝරා නොගැනීම නිසා රු. මිලියන 12.96 ක් වැඩිපුර වැයකර මිලදී ගැනීමට සිදු වී තිබුණි. | රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් අවශ්‍යතාවයේ ප්‍රමුඛත්වය මත ලිපිගොණු දෙකක් යටතේ මිල ගණන් කැඳවන ලද බව හා එම හේතුව නිසාම ලැබුණු මිල ගණන් ප්‍රමාණය සීමාවීම හා තොග ලැබීමට විශාල කාල ප්‍රමාදයක් ගත වී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (v) | රු.මිලියන 18.03 ක් වැයකර Synthetic Black සපත්තු යුගල 10,500 මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කළ සැපයුම්කරුගෙන් මිලදී ගෙන නොතිබුණු අතර, පිරිවිතර 06 ක් නොගැලපුණු හා රු. 737,100 ක වැඩි මිලක් ඉදිරිපත් කළ සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගෙන තිබුණු අතර, මාස 20 කට ආසන්න කාලයක් ප්‍රමාද වීම නිසා සිවිල් නිලධාරීන්ගේ පාවහන් අවශ්‍යතාවය අදාළ කාලය තුළ සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි. තවද, රු. 111,205 ක ප්‍රමාද දඩ අයකර නොතිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ක්ෂේත්‍ර හා තත්ත්ව පරීක්ෂණ වාර්තා පදනම් කරගෙන ප්‍රමුඛතාවයන් සළකා බලා ඇති බව හා රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා ප්‍රමාදයන් සිදු වී ඇති බව. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයන් සළකා බැලිය යුතු වීම සහ ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද දඩ අයකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (vi) | රු. මිලියන 15.98 ක් වැයකර ඖෂධ සැරහුම් ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී ඇණවුම් කළ තොගයෙන් සියයට 10 ක ප්‍රමාණයක් ලැබීමට වසරකුත් මාස 03 ක කාලයක් ගත වී තිබුණු අතර, භාණ්ඩ නොසැපයීම සම්බන්ධයෙන් සැපයුම්කරුවන්ට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පැවති කොරෝනා තත්ත්වය මෙම ප්‍රමාදයන්ට මූලික වශයෙන් බලපා ඇති බව. | සැලසුම් කළ පරිදි ප්‍රසම්පාදනයන් සිදු කර ගැනීමටත්, සැපයුම්කරුගේ ප්‍රමාදයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |
| (vii) | රු.මිලියන 14.86 ක් වැයකර Single Axis Foots සහ Dynamic Foots 880 සහ Adapters 610 ක් මිලදී ගැනීමේදී අදාළ තොග ගබඩාවට ලැබීමට වර්ෂ දෙකකට අධික කාලයක් ගතවී තිබුණු අතර, රු.මිලියන 1.26 ක ප්‍රමාද දඩ අයකර නොතිබුණි. ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබාදී තිබුණද, රු. මිලියන 8.1 ක වැඩි පිරිවැයක් දරා ජර්මනියේ නිෂ්පාදිත උපකරණ මිලදීගෙන තිබුණි. | පැවති කොවිඩ් තත්ත්වය නිසා විදේශ සැපයුම් ආයතන වසා තිබීම හා ණයවර ලිපි විවෘතකර ගැනීමට විශාල කාලයක් ගතවීම මෙම ප්‍රමාදයන්ට හේතු වී ඇති බව හා සනීපාරක්ෂිත භාවය, කල්පැවැත්ම හැසිරවීමේ පහසුව යන සාධක සැලකිල්ලට ගෙන උසස්ම තත්ත්වයේ උපකරණ මිලදී ගැනීමට කටයුතු කරන ලද බව. | ප්‍රසම්පාදන කටයුතු මනා ලෙස සැලසුම් කළයුතු වීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුගතව රජයට වාසිදායක ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු වීම. |
| (viii) | රු. මිලියන 14.52 ක් වැයකර Knee Joint and Components උපකරණ වර්ග 14 ක අයිතම 535 ක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ කර නොතිබුණු අතර, ප්‍රසම්පාදන කටයුතු සඳහා වසර 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණු නිසා ආබාධිත හමුදා සෙබලුන්ගේ අවශ්‍යතා සපුරාලීමට බාධාවක් වී තිබුණි. Socket adaptor with pyramid 45 ක් හා Socket attachment block for thermo plastic Socket (circumference distal 400 mm) 75 ක් අඩුම මිල ඉදිරිපත් කළ ආයතනයෙන් මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණු අතර, එම අයිතමයන් පමණක් සැපයීමට එම සැපයුම්කරු එකඟ නොවීම නිසා එම අයිතමයන්ද තෝරාගත් සැපයුම්කරුගෙන්ම මිලදී ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නැවත නිර්දේශ කර තිබුණි. එම අයිතම වර්ග දෙක සඳහා සහ සියළුම අයිතම අඩු මිල ඉදිරිපත් කළ එම ලංසුකරුගෙන් ප්‍රසම්පාදනය කර ගත්තේනම් රජයට රු. මිලියන 7.34 ක වියදමක් ඉතිරිකර ගත | කොරෝනා ව්‍යාප්තිය හමුවේ සැපයුම් ආයතන වසා තිබීම හේතුවෙන් ප්‍රමාදයක් සිදුවී ඇති බව හා සනීපාරක්ෂිත බව, කල්පැවැත්ම, මනාව හැසිරවීම යන කරුණු සලකා බලා ලොව උසස් තත්ත්වයේ උපකරණ රණවිරුවන්ට ලබාදිය යුතු බැවින් කාර්මික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත මිලදී ගැනීම සිදුකර ඇති බව. | අවශ්‍ය කාලපරිච්ඡේදය හඳුනාගෙන සැපයුම් ලබාගත යුතු වීම හා රජයට වඩා වාසිදායක ලෙස ප්‍රසම්පාදනයන් සිදුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | හැකිව තිබුණු අතර, විකලාංග කාර්මික ශිල්පීන්ගේ පරික්ෂණ වාර්තාවක් මත තෝරාගත් සැපයුම්කරුගෙන් මිලදී ගත් බව සඳහන් කර තිබුණද, එවැනි විකලාංග කාර්මික ශිල්පීන්ගේ නිර්දේශ ඇතුළත් වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, රු. මිලියන 1.09 ක් වැය කර Cluth lock 50 ක් සැපයූ සැපයුම්කරු පිරිවිතරවලට එකඟතාවය පලකර නොතිබුණු අතර, වගකීම් කාලය සම්බන්ධයෙන්ද කිසිදු සහතිකයක් ලබා දී නොමැති බවට තාක්ෂණික ඇගයීම් කමිටුව දක්වා තිබියදීත් එම සැපයුම්කරුගෙන් මිලදී ගෙන තිබුණි. | | |
| (ix) | රු.මිලියන 7.88 ක් වැයකර i5 වර්ගයේ පරිගණක 60 ක් සහ UPS 60 ක් මිලදී ගැනීමේදී ලංසු ලේඛනයේ නිශ්චය කොට දක්වා නොමැති ඇගයීම් සාධක ලංසු අගැයීමේදී භාවිතාකර තිබුණි. පිරිවිතර ලේඛන මඟින් විශේෂ අවස්ථා සඳහා භාවිතා කරන Casing Type ATX Tower with 400 W හෝ ඊට ඉහළ PSU අගයක් සහිත පරිගණක සඳහා මිල ගණන් ඉල්ලා තිබීම නිසා ලංසුකරුවන් 184 දෙනෙකුගෙන් 07 දෙනෙකු පමණක් මිල ගණන් සපයා තිබුණි. තවද, එක් ලංසුකරුවෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කළ Casing Type - ATX Tower with 260W පරිගණකය සුදුසු බවට නිර්දේශකර මිලදී ගෙන තිබුණු අතර, මෙය මිල තරඟය සීමා කිරීමට කටයුතු කිරීමක් හා එක් භාණ්ඩ වර්ගයක් සඳහා මිල ගණන් කැඳවා තවත් භාණ්ඩ වර්ගයක් මිලදී ගැනීමට කටයුතු කිරීමක් ලෙසද නිරීක්ෂණය කෙරේ. තවද, සැපයුම්කරු විසින් නිසි ප්‍රමිතීන්ට සපයා නොතිබූ PSU දෙකක් නැවත සැපයීමට මාස 04 කට ආසන්න කාලයක් අනුමැතියකින් තොරව ප්‍රමාද කර තිබුණි. | යුද්ධ හමුදාව සඳහා අවශ්‍ය තාක්ෂණික පිරිවිතරයන්ගෙන් සමන්විත උපකරණ මිලදී ගැනීමට හැකියාව ඇති බව. | ප්‍රසම්පාදන කටයුතු මනා ලෙස සැලසුම් කළයුතු වීම හා අවශ්‍යතාවයන් මෙන්ම වෙළඳපල තත්තවයන්ද හඳුනාගෙන පිරිවිතර ලේඛන පිළියෙල කළ යුතු අතර, මිල තරඟය සීමා කිරීමට පිරිවිතර පාදකකර නොගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (x) | රු.මිලියන 4.6 ක් වැයකර PA SYSTEM ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන සැලැස්මේ රු. මිලියන 1.52 ක් ඇස්තමේන්තු කර තිබුණද, රු. මිලියන 4.59 ක් වැයකර එම උපකරණ ප්‍රසම්පාදනය කරගෙන තිබුණු අතර, 6.3.6 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කටයුතු නියමිත ආකෘති පත්‍ර ප්‍රකාරව වාර්තා කර නොතිබුණි. | ඩොලරයේ අගය උච්චාවචනය වීම නිසා ඇස්තමේන්තුව ඉක්මවා ගොස් තිබුණු බව හා සංචරණ සීමා හේතුවෙන් ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පුද්ගලයින් සහභාගීකර ගැනීම සීමා කර තිබුණු බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම සහ ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (xi) | රු.මිලියන 2.84 ක් වැයකර පයිපින් යාර 240,000 ක් මිලදී ගැනීමේදී පිරිවිතර ලේඛන පිළියෙලකර නොතිබුණු අතර, ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසුකරුවන් තෝරාගත් බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. එකම පුද්ගලයෙකුට හෝ ඔහුගේ ඥාතීන්ගේ නම් වලින් පවත්වාගෙන යන ආයතන දෙකක් තෝරාගෙන මිලදී ගැනීම සිදුකර තිබුණු අතර, 6.3.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව පවත්වා ගත යුතු ලේඛන පවත්වා නොතිබුණි. තවද, රු. 113,600 ක ප්‍රමාද දඩ අයකර නොතිබුණි. | පැවති කොවිඩ් අවධානම් තත්ත්වය නිසා විශේෂඥ ආයතනවල සහාය ලබා ගැනීමට නොහැකි වීමෙන් පිරිවිතර ලේඛන සකස්කර නොමැති බව සහ අදාළ තොග නියමිත දිනට ලැබී ඇතත්, පැවති කොවිඩ් අවදානම නිසා තොග ගත කිරීම සහ ලැබීම් සහතික නිකුත් කිරීම ප්‍රමාද වී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම සහ ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද දඩ අයකළ යුතු වීම. |
| (xii) | රු.මිලියන 1.22 ක් වැයකර දියකාවා යුධ පුහුණු අභ්‍යාසය සඳහා G28 ඝණකමකින් යුතු 8' x 32” ප්‍රමාණයේ GI රැළි සහිත තහඩු 750 ක් සහ 12' x 32” ප්‍රමාණයේ තහඩු 870 ක් මිලදී ගැනීමේදී මිලදී ගැනීමට අපේක්ෂා කළ G28 ඝණකම සෙවිළි තහඩු වෙනුවට එක් ලංසුකරුවෙකු ඉදිරිපත් කළ G34 අඩු ඝණකම සෙවිළි තහඩු මිලදීගෙන තිබුණු අතර, අවශ්‍යතාවය හඳුනා නොගෙන තාක්ෂණික පිරිවිතර සකස් කර තිබුණි. තවද, තහඩු 450 ක් සඳහා මිල ගණන් කැඳවා තහඩු 1,620 ක් මිලදී ගැනීම නිසා ප්‍රමාණය වැඩිවීම මත ලබාගත හැකිව තිබූ වට්ටම් හෝ මිල වාසිය ලබාගත නොහැකි වී තිබුණි. | රට තුළ පැවති කොවිඩ් වාතාවරණය හේතුවෙන් භාණ්ඩ හිඟතාවය සහ සේවාවේ අවශ්‍යතාවය මත නියමිත දිනට නැවත මිල ගණන් කැඳවා මිලදී ගැනීමට සුදුසු වාතාවරණයක් නොතිබුණු හෙයින් සහ ණය පදනම මත සැපයීමට එකඟ වූ එකම ආයතනයෙන් මිලදී ගැනීම සිදු කර ඇති බව සහ අවස්ථානුකූලව සේවාව කඩිනමින් ඉටු කර ගැනීමේ අරමුණින් ඇස්තමේන්තු නොසලකා හැර අදාළ භාණ්ඩ මිලදී ගෙන ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම සහ මිල තරඟය සීමා කිරීමට කටයුතු කිරීමත්, එක් භාණ්ඩ වර්ගයක් සඳහා මිල ගණන් කැඳවා තවත් භාණ්ඩ වර්ගයක් මිලදී ගැනීමත් නොකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (xiii) | රු.මිලියන 1.08 ක් වැයකර Sofa Set 2 ක් සහ Coffee Table 2 ක් මිලදී ගැනීමේදී වාර්ෂික ප්‍රසම්පාදන සැළසුමට ඇතුළත් කර නොතිබුණු අතර, පිරිවිතර ලේඛන ලංසුකරුවන්ට යැවූ බවට සඳහන් කළද, පිරිවිතර අනුව ලංසු ඉදිරිපත් නොකිරීම නිසා සියයට 6 සිට සියයට 52 දක්වා විශාල මිල උච්චාවචනයන් සහිතව මිල ගණන් ඉදිරිපත්වී තිබුණි. තවද, පිරිවිතර පිළිබඳව අවධානය යොමු නොකර මිලදී ගැනීම සිදුකර තිබුණි. සැපයුම්කරු විසින් භාණ්ඩ සඳහා වගකීම් කාලයක්ද ලබාදී නොතිබුණි. | මිල ගණන් ඉදිරිපත් කළ ආයතන වෙත ගොස් ඉදිරිපත් කරන ලද නිදර්ශක පරීක්ෂා කර බලා නිර්දේශ ලබාදීමට කටයුතු කරන බව හා ගුණාත්මක භාවය, උසස් නිමාව, කල්පැවැත්ම හා ශක්තිමත්භාවය පරීක්ෂා කර මිලදී ගැනීම සිදු කර ඇති බව. | නිශ්චිත පිරිවිතර ලංසුකරුවන්ට ලබාදිය යුතු අතර, ලංසු ඇගයීමේදී ද පිරිවිතර පිළිබඳ සලකා බැලිය යුතු වීම සහ රජයට වඩා වාසිදායක ලෙස වගකීම් කාලයන් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සාම සාධක රාජකාරීන් සඳහා මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට නියමිත 685 ක හට පිරිසක් සඳහා අවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ 2016 හා 2017 වර්ෂ තුළදී මිලදී ගෙන තිබුණු අතර, මෙම මිලදී ගත් ප්‍රවාහන හා අනෙකුත් උපකරණ අතරින් වටිනාකම් අනාවරණය කෙරුණු රු. බිලියන 1.38 ක ප්‍රවාහන හා උපකරණද, වටිනාකම් අනාවරණය නොකෙරුණු තවත් වාහන හා උපකරණ තොගද, නිශ්කාර්යව දියවන්නේ විවිධ ප්‍රදේශවල ගබඩාකර තිබුණි. | අදාළ භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ අවශ්‍යතාවය පරිදි උපයෝජනය කිරීමට කටයුතු කරනු ලබන බව. | අවශ්‍යතාවය පරිදි භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කළ යුතු අතර, මේ වනවිටත් මිලදී ගෙන ඇති මෙම ප්‍රවාහන හා උපකරණ තොග රජයට උපරිම වාසි සැලසෙන පරිදි උපයෝජනය කළයුතු විම. |
| (ආ) | යුධ සමයේ ත්‍රස්තවාදීන්ගෙන් අත්පත් කරගත් වාහන 595 ක නීත්‍යානුකුල අයිතිය යුද්ධ හමුදාව වෙත පවරා ගෙන නොතිබුණු අතර, යුද්ධ හමුදාවට අයිති වාහන 3,070 ක් සඳහා රක්ෂණාවරණ ලබා ගෙන නොතිබුණි. | මෙම වාහන පවරා ගැනීම සඳහා අවස්ථා කිහිපයක දීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම්කර ඇති බව සහ රක්ෂණාවරණ ලබා ගෙන නොමැති ඉතිරි වාහන සඳහා රක්ෂණාවරණ ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව. | වාහනවල නීත්‍යානුකුල අයිතිය පවරා ගැනිමටත්, රක්ෂණයකර නොමැති වාහන සඳහා රක්ෂණාවරණ ලබාගැනීමටත් කටයුතුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2007 වර්ෂයේදී පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු විසින් සම්පාදිත මු.පි.මහ 3784 දරන නීත්‍යානුකූල පිඹුර මඟින් මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටෙයාර් 14 ක ඉඩමක් කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් විසින් 2007 වර්ෂයේදී යුද්ධ හමුදාවට පවරා දී තිබුණු අතර, මෙම ඉඩම නිශ්කාර්යව පැවතීම නිසා අනවසර පදිංචිකරුවන් විසින් බලහත්කාරයෙන් පදිංචි වී සිටින බව 2016 වර්ෂයේදී මැනීම් කටයුතු සිදු කිරීමට යාමේදී යුද්ධ හමුදාව විසින් අනාවරණය කර ගෙන තිබුණද මෙම ඉඩමේ අනවසර පදිංචිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගෙන පදිංචිකරුවන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | අදාළ ඉඩම නිරවුල් කර ගැනීම සඳහා නීතිපති ගෙන් ඉල්ලීම් කර ඇති බව. | යුද්ධ හමුදාවේ වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | මඩකලපුව දිස්ත්‍රික්කයේ වාර්ෂිකව රු. මිලියන 1.7 ක් වැයකර අක්කර 5.74 කට අයත් බිම් කොටස් 39 ක් නිවාස හෝ ගබඩා ඉදිකිරීම සඳහාත්, දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් වාර්ෂිකව එකතුව රු.මිලියන 187.37 ක් වැයකර වර්ග අඩි 217,191 ක ගොඩනැගිලි 39 ක් නවාතැන් පහසුකම්, කාර්යාල හා ගබඩා පහසුකම් සලසා ගැනීම සඳහාත්, වර්ෂ 30 කට අධික කාලයක සිට කුලී පදනම ලබාගත් ඉඩම් හා ගොඩනැගිලි වෙනුවට රජය සතු වෙනත් ඉඩම් හෝ ගොඩනැගිලි සපයා ගැනීමට මෙතෙක් අවධානය යොමු වී නොතිබුණි. | මෙම ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිකරුවන් හඳුනාගෙන නැවත භාරදීමට කටයුතු කරන බව සහ යුද්ධ හමුදාවේ අවශ්‍යතාවය පරිදි ගොඩනැගිලි 39 ක් කුලී පදනම මත ලබා ගෙන ඇති බව. | රජය සතු වත්කම්වලින් උපරිම ප්‍රයෝජනය ගෙන වියදම් සීමා කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | විධිමත්ව පවරා ගැනීමකින් තොරව යුද්ධ හමුදාව විසින් වෙනත් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු රජයේ තවත් ආයතනවලින් අණ හා මාණ්ඩලික රථ 03 ක්ද, ඩබල් කැබ් රථ 02 ක්ද, ජීප් රථ 04 ක්ද, කැබ් රථ 06 ක්ද, බස් රථ 05 ක්ද, භාණ්ඩ ප්‍රවාහන වාහන 02 ක්ද, ජල බවුසර් 17 ක්ද , ටිපර් රථයක්ද, ගලි වේලර් රථයක්ද, ගිලන් රථ 07 ක්ද, යතුරු පැදි 11 ක්ද පරිහරණය කරමින් පවතී. | රජයේ දෙපාර්තමේන්තු ඇතුලු තවත් සිවිල් ආයතන වාහන යුද්ධ හමුදාවට පරිත්‍යාග කර ඇති බව හා යුද්ධ හමුදා ක්‍රමවේදයට අනුව පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා යුහ අංක ලබාදී ඇති බව. | අදාළ වත්කම් විධිමත්ව පවරා ගැනීමට හෝ අදාළ ආයතන වෙත මුදා හැරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | විධිමත් අනුමැතියකින් තොරව යුධ හමුදාවට අයත් KA -5972 (යුහ 16024) දරන ටොයෝටා කෙරොල්ලා කාර් රථය හා 52-5035 (යුහ 0157) දරන නිශාන් ඩබල් කැබ් රථය තෙවන පාර්ශවයන් වෙත අවිධිමත්ව මුදා හැර තිබුණි. | කාර් රථය මේජර් ජෙනරල් අනුරුද්ධ රත්වත්තේගේ ලඟම ඥාතියෙකුගේ ප්‍රයෝජනය සඳහා 2005 වර්ෂයේ සිටත්, ඩබල් කැබ්රථය සිරි සීලවිශුද්ධි මහානායක හිමිගේ ප්‍රයෝජනය සඳහා 1995 වර්ෂයේ සිටත් ලබාදී ඇති බව. | රජයේ වත්කම් නිසි අනුමැතියකින් තොරව තෙවන පාර්ශවයන්ට මුදා නොහැරිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා නොගෙන රු. මිලියන 2.44 ක් වැයකර මිලදී ගත් රෙදි සෝදන යන්ත්‍ර 29 ක, ඩිජිටල් තරාදි 16 ක රූපවාහිනී යන්ත්‍ර, ස්ටැබිලෛයිසර් ඇතුළු විදුලි උපකරණ අයිතම 66 ක වර්ෂයක නිදහස් වගකීම් කාලයද අවසන් වී තිබූ අතර එම භාණ්ඩ පරිහරණයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි | මෙම විදුලි උපකරණ කොරෝනා නිරෝධායන මධ්‍යස්ථාන වෙත ලබා ගෙන ඇති අතර, වසංගතය පැතිරීම පිළිබඳ පූර්ව නිගමනයන්ට එළඹීම අපහසු බැවින් ආරක්ෂිතව ගබඩා කර ඇති බව. | අවශ්‍යතාවය සහ නිකුත් කිරීම් නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. |
| (ඈ) | නිදහස් වගකීම් කාලය වසරක් පමණක් ඇති රු. මිලියන 3.9 ක් වැයකර මිලදී ගන්නා ලද 50 kg ඩිජිටල් තරාදි 34 ක්, සණ අඩි 20 අධිශීතකරණ 08 ක් , සණ අඩි 08 ශීතකරණ 03 ක් ඇතුලු විද්‍යුත් හා විදුලි උපකරණ අයිතම 65 ක් මිලදී ගැනීමෙන් පසු මාස 05 සිට මාස 12 ක අතර, කාල පරිච්ඡේදයක් රාගම හා වේයන්ගොඩ යුද්ධ හමුදා ගබඩා තුළ නිශ්කාර්යව ගබඩාකර තිබුණි. | තරාදි හා ශීතකරණ අවශ්‍යතාවය අනුව නිකුත් කරනු ලබන බව. | අවශ්‍යතාවය සහ නිකුත් කිරීම් නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකළ යුතු වීම. |
| (එ) | අවශ්‍යතාවය සහ පාරිභෝජනය නිසි ලෙස හඳුනානොගෙන වර්ෂ කිහිපයකට පෙර මිලදී ගන්නා ලද යකඩ මේස 25 ක්, වානේ කබඩ් 222 ක්, අමුත්තන්ගේ පුටු 113 ක් නිකුත් නොකර රාගම යුද්ධ හමුදා ගබඩාවේ ගබඩා කර තිබුණු අතර, 2011 වර්ෂයටත් පෙර මිලදී ගෙන තිබුණු නිල ලාංඡන, කැප්, කමිස සහ බොත්තම්වලින් සමන්විත නිල ඇඳුම් තොග අයිතම 16 ක තොග ඒකක 69,669 ක් වේයන්ගොඩ යුද්ධ හමුදා ගබඩා තුළ ගබඩා කර තිබුණි. සෙමෙන් නිකුත්වීම නිසා මෙම රෙදි සහ නිල ලාංඡන දුර්වර්ණ වීම, දිරායාම් වැනි තත්ත්වයන්ට පත් වී තිබුණු අතර, මෙම තොගවල වටිනාකම විගණනයට අනාවරණය නොකෙරුණි. | අවශ්‍යතාවය අනුව මෙම තොග නිකුත් කරනු ලබන බව. | - එම - |
| (ඒ) | රු. මිලියන 3.4 ක් වැයකර මිලදී ගෙන තිබූ කවර් අවුටර්ස් 200 ක් නිකුත් නොකර වර්ෂ 01 සිට 05 කට ආසන්න කාලයක් තුළ රාගම ගබඩා සංකීර්ණයේ රඳවා තබා ගැනීම නිසා මේවායේ කාර්යක්ෂමතාවයට හානි සිදු වී තිබුණි. | මෙම කවර් අවුටර්ස් භාවිතා කරන වාහන ධාවනයෙන් ඉවත් කිරීම නිසා මෙම තත්ත්වය හටගෙන ඇති බව හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයන් අනුව නිකුත් කිරීම් සිදු කරනු ලබන බව. | -එම - |
| (ඔ) | යුද්ධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන බිම් කැබලි 569 කට අයත් අක්කර 20,656 ක් තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | තක්සේරු වාර්තා ලබාදීමේ ප්‍රමාදය මෙසඳහා හේතු වී ඇති බව සහ කඩිනමින් තක්සේරුකර ගිණුම්ගත කිරීමට පියවර ගන්නා බව. | අදාළ ඉඩම් කඩිනමින් තක්සේරුකර ගිණුම්ගත කළයුතු වීම. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වේරහැර ප්‍රදේශයේ යුද්ධ හමුදා ඖෂධ ගබඩාවක් ස්ථාපිතකර තිබුණු අතර, මෙම ගොඩනැගිල්ල ඖෂධ ගබඩා කිරීම සඳහා තිබිය යුතු ප්‍රමිතීන් අනුව සකස්කර නොතිබුණු අතර, ආරක්ෂිත කැමරා පද්ධතියක්ද සවිකර නොතිබුණි. covid – 19 රෝගය වළක්වා ගැනීමට අවශ්‍ය රු.මිලියන 45.6 ක් වටිනා විවිධ වෛද්‍ය අයිතමයන්, එතනෝල් හා සනීපාරක්ෂක ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මෙම ගොඩනැගිල්ලේ තරප්පුපෙලෙහි සහ ඉහළ මහලයේ කොරිඩෝවේ අවිධිමත්ව ගබඩාකර තිබුණි. වැසි දිනවලදී මෙම ගබඩා ද්‍රව්‍යයන් තුළට වැසි ජලය ගලා ඒමේ අවධානමක් පැවතුණි. ඖෂධ ගබඩා කිරීම සඳහා වර්ග අඩි 14,450 ක ගබඩාවක් මෙම පරිශ්‍රයේම ඉදිකිරීමට සැලසුම් කර තිබුණද එහි ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොතිබුණි. | මෙම ගොඩනැගිල්ල තාවකාලිකව ස්ථාපිත කර ඇති බව සහ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිත බව. | සැලසුම් කළ ඖෂධ ගබඩා ගොඩනැගිල්ල කඩිනමින් ඉදිකිරීමට පියවර ගත යුතු වීම සහ එතෙක් අදාළ ඖෂධ හා වෛද්‍ය සැපයීම් ද්‍රව්‍යවලට හානි නොවන ලෙස ගබඩා පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.5 පාඩු හා හානි**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ආයුධ ඇතුළු යුද්ධ හමුදාවේ විවිධ වත්කම්වලට සිදුවූ රු. බිලියන 13.78 ක අලාභ හානි 125 ක් හා රිය අනතුරු 497 කට අදාළව සිදුවූ රු. මිලියන 282.05 ක අලාභ ලෙස එකතුව රු. බිලියන 14.06 ක වර්ෂ අවසාන ශේෂයක් පැවති අතර, මෙම අලාභ හානිවලට වසර 10 කට වැඩි සිද්ධි 119 කට අදාළව රු. මිලියන 840.7 ක අලාභයන්ද, වසර 05 ට වැඩි සිද්ධි 263 කට අදාළව රු. බිලියන 12.99 ක අලාභයන්ද පැවතුණි. මෙම ශේෂ අයකර ගැනීම හෝ කපා හැරීම මන්දගාමී ස්වභාවයක පැවති අතර, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ අලාභහානි 16 කට අදාළ රු. මිලියන 47 ක ආරම්භක ශේෂයන් පමණක් අනාවරණයකර තිබුණි. අනෙකුත් අලාභහානි සම්බන්ධයෙන් | අදාළ ශේෂයන් අයකර ගැනීමට හෝ කපා හැරීමට අවැසි ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව සහ ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනයන් මඟින් ආරම්භක ශේෂයන් අනාවරණය කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | අදාළ අලාභ හානි අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතු වීම හා ආරම්භක ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණයකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ආරම්භක ශේෂයන් හෙළිදරවු කර නොතිබුණි. | | |
| (ආ) | රිය අනතුරු 12 කට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත්කර නොතිබුණු අතර, 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලයේදී සිදුවූ අලාභයන් තක්සේරු නොකළ රිය අනතුරු සංඛ්‍යාව 88 ක් විය. | මෙම අලාභ හානි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශ මඟින් අනාවරණය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | අදාළ අලාභ හානි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කළ යුතු වීම. |
| (ඇ) | යුද්ධ හමුදාවේ සිදු වී ඇති රු. මිලියන 4.47 ක සලාක අක්‍රමිකතාවයන්ට අදාළව සියයට 25 ක දෙපාර්තමේන්තු ගාස්තු මෙතෙක් අය කරගෙන නොතිබුණි. | යුද්ධ හමුදාධිපති නිගමනය සංශෝධනය කර දෙපාර්තමේන්තු ගාස්තු ඉදිරියේදී අයකර ගැනීමට අවැසි කටයුතු සිදු කරමින් පවතින බව. | අදාළ දෙපාර්තමේන්තු ගාස්තු අයකර ගත යුතු වීම. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂවල අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන මිලදී ගත් ඇතැම් උපකරණ, ලිපිද්‍රව්‍ය, විදුලි උපකරණ, කවර් අවුටර්ස් හා බැටරි දීර්ඝ කාලයක් රාගම යුධ හමුදා ගබඩා සංකීර්ණයේ නිෂ්කාර්යව රඳවා තබා ගෙන එම තොග ඒකක කල් ඉකුත් වීම හෝ පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වීම නිසා 2021 වර්ෂයේ රු. 100,405 ක් වටිනා භාණ්ඩ වර්ග 10 කට අයත් භාණ්ඩ අයිතම 390 ක් අපහරණය කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 3.37 ක් වටිනා භාණ්ඩ වර්ග 27 කට අයත් භාණ්ඩ අයිතම 353 ක් අපහරණය කිරීමට යෝජනා කර තිබුණි. මේ නිසා එකතුව රු.මිලියන 3.47 ක් වටිනා භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම්වලින් රජයට නිසි ආර්ථික ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | ප්‍රයෝජනයට නොගෙන භාවිතයට නුසුදුසු තත්ත්වයට පත්වීම හේතුවෙන් ගබඩාවල නිකුත් නොවී පවතින භාණ්ඩ අයෝග්‍ය කිරීමේ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර තොගයෙන් ඉවත් කිරීම සිදුකරනු ලබන බව. | අවශ්‍යතාවය සහ නිකුත් කිරීම් ප්‍රමාණයන් පිළිබඳව සැලකිලිමත් වෙමින් භාණ්ඩ ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක්, තෘතීක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 83 ක් ඇතුළු සමස්ථ පුරප්පාඩු 1,456 ක් සහ යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා ප්‍රාථමික, ද්විතීක, තෘතීක මට්ටමේ පුරප්පාඩු 20,923 ක් පැවතුණද, ඊට ගැළපෙන ආකාරයට අනුමත සේවක | රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම නැවත දැනුම් දෙනතුරු අත්හිටුවා ඇති බැවින් එම පුරප්පාඩු පිරවීමට | පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැලපෙන ආකාරයට |

| | | |
|---|---|---|
| සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම හේතුවෙන් විවිධ පරිපාලන දුෂ්කරතා මතු වී තිබුණි. තවද, සේවයේ නියුතු තත්‍ය කාර්ය මණ්ඩල වලින් සමාලෝචිත වර්ෂයේ කිසියම් හෝ පුහුණුවකට යොමු කරන ලද නිලධාරීන්/සේවකයින් ගණන 52,752 කට සීමා වී තිබුණි. | නොහැකි විය. තවද, ඖෂධ, තෘතික හා ද්විතීක මට්ටම්වල පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දැනුම්දී ඇති බව සහ රට තුළ පැවති කොවිඞ් වසංගත තත්ත්වය නිසා සැලසුම් කළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි වීමෙන් මෙම තත්ත්වය උදා වී ඇති බව. | අනුමත සේවක සංඛ්‍යාව සාමාලෝචනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම සහ සේවක පුහුණුව තුලින් කාර්යසාධනය ඉහල නංවා ගැනිමට කටයුතු කළයුතු වීම. |